**www.wsws.org**

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සාම්පූර් අල්ලා ගැනීමෙන් ශ්‍රී ලංකාව තුල සිවිල් යුද්ධය උත්සන්න කිරීමට වේදිකාව සැකසෙයි

## Capture of Sampur sets stage for intencification of civil war in Sri Lanka

**සරත් කුමාර විසිනි**
**2006 සැප්තැම්බර් 08**

දින ගනනාවක සටනකින් පසුව, ශ්‍රී ලංකා ආන්ඩුවේ හමුදා පසු ගිය ඉරිදා, නැගෙනහිර වැදගත් නගරයක් වූ සාම්පූර්, එල්ටීටීඊය වෙතින් තමන්ගේ යටතට ගත්තේ ය. එල්ටීටීඊයට එරෙහි ප්‍රහාරය පුලුල් කිරීමට මිලිටරිය අදහස් කරන බව අඟවමින් කොලඹ ආන්ඩුව හා මාධ්‍ය මෙම ක්‍රියාන්විතය දැවැන්ත ජයග්‍රහනයක් ලෙස හුවා දැක්වී ය.

දහස් ගනනක් හමුදා භටයන් යොදවා ගත් මෙහෙයුම, අගෝස්තු 26 දා සිට දින නමයක් පුරා පැවතුනි. දහස් ගනන් සිවිල් වැසියන්ට පලායාමට බල කෙරෙමින් ගුවන් හමුදා ප්‍රහාරක ජෙට්යානා සාම්පූර් හා අවට ප්‍රදේශවලට ඉවක් බවක් නැතිව බෝම්බ හෙලී ය. හමුදාව සාම්පූර් වෙත පිවිසීමට කලින් එල්ටීටීඊ සටන්කරුවන් ඉවත් වූහ.

මිලිටරි ප්‍රකාශකයාට අනුව හමුදාවේ 15ක් මියගිය අතර 90ක් තුවාල ලැබී ය. එල්ටීටීඊ භටයන් 90 කට වැඩි සංඛ්‍යාවක් මරා දැමුනි. එහෙත් මරන සංඛ්‍යාව හෝ සටනේ තීව්‍රතාවය ස්වාධීනව සනාථ කෙරී නැත. ප්‍රදේශය තුල සිවිල් වැසියන් සිටින බව මිලිටරිය විසින් ප්‍රතික්ෂේප කල අතර එල්ටීටීඊ ප්‍රකාශකයෙකු නිවේදනය කලේ සිවිල් වැසියන් 97 දෙනෙක් මියගොස් ඇති බවයි.

2002 සටන් විරාමය විවෘතව උල්ලංඝනය කිරීමක් වන සාම්පූර් අල්ලා ගැනීම මගින් පැහැදිලි කෙරෙන්නේ ආන්ඩුව සටන් විරාමය ආරක්ෂා කරන්නේ නමට පමනක් බවයි. ප්‍රධාන වරායක් හා නාවික කඳවුරක් වන ත්‍රිකුනාමලයට විරුද්ධ දිශාවෙන් පිහිටා ඇති සාම්පූර්, දිගු කලක් තිස්සේ මිලිටරියේ ප්‍රධාන ඉලක්කයක්ව තිබුනි. එහි එල්ටීටීඊ මධ්‍යස්ථාන වෙත ප්‍රථම ගුවන් ප්‍රහාර එල්ල වූයේ අප්‍රේල් මාසයේ ය. මෙය මතුපිටින් පෙනීගියේ, හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකාගේ ජීවිතය අනූනමයෙන් බේරුනු, කොලඹ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයට ප්‍රතිප්‍රහාරයක් ලෙස ය. ජනාධිපති මහින්ද රාජපක්ෂ ජූලි අග දී මාවිල්ආරු අමුන මුදා ගැනීමේ ප්‍රධාන මිලිටරි ප්‍රහාරය දියත් කලේ, ගොවීන්ට ජලය සැපයීමේ "මානුෂික" හේතුව ඉදිරිපත් කරමිනි. මෙය එල්ටීටීඊයේ ප්‍රතිප්‍රහාරයක් අවුලුවා ලූ අතර ඔවුන්. සාම්පූර්වලට යාබද මුතූර් හි සමහර කොටස් තාවකාලිකව අල්ලා ගෙන ත්‍රිකුනාමල වරායට ෂෙල් ප්‍රහාර එල්ල කලහ. මිලිටරිය, ගුවන් හා කාලතුවක්කු ප්‍රහාර මගින් ප්‍රතිචාර දැක්වූහ.

"අපගේ හමුදා බලඇනි සාම්පූර් අල්ලාගෙන ඇත්තේ එහි ජීවත්වන ජනතාවගේ ශුභසිද්ධිය හා යහපත වෙනුවෙන් ය" යි ප්‍රකාශ කරමින් රාජපක්ෂ, මෑත ම ක්‍රියාන්විතයට මානුෂික සලුපැලඳවීමට ද උත්සාහ කරයි. සැබවින් ම මේ තර්කය එල්ටීටීඊයේ ඕනෑ ම ප්‍රදේශයක් අල්ලාගැනීම සුජාත කිරීම සඳහා ද යොදා ගත හැක. නිශ්චිතව ම, මෙම ක්‍රියාන්විතය ගෙන ගියේ "මහජන ශුභසිද්ධිය" ගැන හෝ සටන් විරාම ගිවිසුමේ කොන්දේසි ගැන හෝ තැකීමකින් තොරව මිලිටරි අරමුනු මුදුන්පත් කර ගැනීම සඳහා ය.

ජූලි අග පටන් 200,000 කට අධික සිවිල් වැසියන් සංඛ්‍යාවක් අවතැන් වූ අතර අවශ්‍ය තරම් ආහාර හා බෙහෙත් නොමැතිව තාවකාලික කඳවුරුවල විසීමට ඔවුන්ට බල කෙරී තිබේ. මෑත දී සාම්පූර්හි ඇතිවූ සටන්වලින් මඩකලපුව ආසන්නයේ වාකරේහි සරනාගතයන් සංඛ්‍යාව 45,000 තරම් දක්වා වැඩි වී ඇති බව එල්ටීටීඊය පවසයි. එල්ටීටීඊ පාලන ප්‍රදේශවල රැකවරන ලබා සිටින අයට ආධාර සැපයීම ආරක්ෂක හමුදා විසින් ප්‍රතික්ෂේප කර තිබේ.

ආන්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ලේ අභූත ලෙස තර්ක කලේ, මෑත ප්‍රහාරයෙහි අරමුන "ප්‍රදේශ අල්ලාගැනීම" නොවන බවටත් එබැවින් සටන් විරාමය උල්ලංඝනය කිරීමක් ලෙස සැලකීම සාධාරන නොවන බවටත් ය. කෙසේ වුව ද, බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ ප්‍රකාශ කලේ හමුදාව "බලය තහවුරු කර ගනිමින්" සිටින බවත් සාම්පූර් ප්‍රදේශයේ "මිලිටරි කඳවුරු" ඉදි කිරීමට අදහස් කරන බවත් ය. නගරය තුල පොලිස් මුරපොලක් දැනට මත් ඉදි කොට තිබේ. ලංකාදීපයට අනුව හමුදාව දැන් සාම්පූර් අවට ගම්වල පාලනය සියතට ගැනීමේ මිලිටරි මෙහෙයුම්වල නිරතව සිටියි.

සටන් විරාම නිරීක්ෂන කමිටුවේ ප්‍රකාශකයෙකු වන (එස්එල්එම්එම්) තෝෆිනූර් ඕමාර්සන් ආන්ඩුව මිලිටරි ප්‍රහාරය අත්හිටුවා තිබෙන බවට විශ්වාසය පල කලේ ය. එසේ නොවුනානම් එහි අර්ථය 2002 සටන් විරාමය මුලුමනින් ම බිඳ වැටී ඇති බවය යි ඔහු ප්‍රකාශ කලේ ය. "කොටින් අපෙන් අසන්නේ සටන් විරාමය අවසන් ද යනුවෙනි. එය එසේ නොවන්නේ යයි අප සහතිකෙන් ම විශ්වාස කරමු."

## කොලඹ යුද උනුසුම

කෙසේ වුව ද, මිලිටරිය සාම්පූර්හි ලද "ජයග්‍රහනය" කොලඹ පාලක කවයන්ගේ යුද උන්මාදයට පවන්සැලීමක් පමනි. රාජපක්ෂ ඔහුගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සමුලුවට ජයග්‍රාහී විලාසයෙන් කියා සිටියේ " ත්‍රස්තවාදීන්ට තේරෙන භාෂාවෙන්" ආන්ඩුව ප්‍රතිචාර දක්වා ඇති බවයි.

"ආන්ඩුව එල්ටීටීඊයට එරෙහිව මුලු වැර යොදා ප්‍රහාරය දියත් කල යුතු ය"යි සිංහල ස්වෝත්තමවාදී (ජේවීපී) ජනතා විමුක්ති පෙරමුන බල කරයි. අඟහරුවාදා ප්‍රකාශයක් නිකුත් කරමින් ජේවීපී පාර්ලිමේන්තු කන්ඩායම් නායක විමල් වීරවංශ, උද්දාමයට පත්ව මිලිටරිය වර්නනා කල අතර ඔවුන්, " මුලුමහත් නැගෙනහිර පලාතෙන් ම එල්ටීටීඊය අතුගා දැමිය යුතු ය"යි අවධාරනය කලේ ය. "කොටි ත්‍රස්තවාදීන් උතුරු පලාතෙන් ද මුලිනුපුටා දැමිය යුතු ය"යි ඔහු තව දුරටත් කියා සිටියේ ය.

ජේවීපීය දැනට මත් පාර්ලිමේන්තුවේ දී ආන්ඩුවට සහයෝගය දෙන අතර පක්ෂය කැබිනෙට්ටුව තුලට ගෙනඒමට සාකච්ඡා පැවැත්වෙමින් තිබේ. ජේවීපීයේ ඉල්ලීම් 20ට 2002 සටන් විරාමය කටුගා දැමීමත් සාම ක්‍රියාවලියේ විධිමත් පහසුකම් සලසන්නා ලෙස නෝර්වේ ඉවත් කිරීමත් ඇතුලත් වේ. මේ දක්වා රාජපක්ෂ ජේවීපීයේ යුද වැඩ පිලිවෙල විවෘතව වැලඳගැනීම ප්‍රතික්ෂේප කර තිබෙන අතර ඒ වෙනුවට මිලිටරියේ ආක්‍රමනික මෙහෙයුම්වල ස්වභාවය වසං කිරීමට මනාපය දක්වයි.

බදාදා මාධ්‍ය හමුවක දී වීරවංශ හා අනෙකුත් ජේවීපී නායකයන් දේශපාලන ප්‍රහාරයකට අවතීර්න වෙමින් "ධෛර්යය නැතිකම" හා "කෙලින් හිතන්ට" නොහැකිකම ගැන රාජපක්ෂට හා ආන්ඩුවට දොස් නැගී ය. වීරවංශ ප්‍රකාශ කලේ සිව් වසරකට වැඩි කලක් තිස්සේ පවතින සටන් විරාම ගිවිසුම ව්‍යවස්ථාවට පටහැනි බැවින් ඉරාදැමිය යුතු බවයි. ජාතික ව්‍යවස්ථාවත් ඒවායේ ස්වභාවය නිසා ම සිවිල් යුද්ධයට ඉඩ නොසලසන්නාක් මෙන් ම මෙම විකෘති තර්කනයට අනුව, එල්ටීටීඊය සමග මොන ම සාකච්ඡාවක් හෝ සටන් විරාමයක් ද ව්‍යවස්ථා විරෝධී වේ.

කෙසේ වුව ද, හුදෙක් ජේවීපීය පමනක් මෙසේ වනවා ද නො වේ. සමස්ත පාලන සංස්ථාපිතයම සාම්පූර් "ජයග්‍රහනයෙන්" පසුව යුද උන්මාදයෙන් බැඳීගත්හ. 2002 සටන් විරාමය අත්සන් කලා වූ ද ඊනියා සාම ක්‍රියාවලියේ ශූරතාව හිමිකරගත්තා වූ ද විරුද්ධ පක්ෂයේ එක්සත් ජාතික පක්ෂය (යූඇන්පී) යුද්ධය කරා පල්ලම් බැසීමට විරුද්ධ නොවී ය. මෙම සතියේ යූඇන්පීය මැත ම ප්‍රහාරය පිලිබඳව විවෘතව ම සිය "සතුට" පලකල අතර සාම්පූර් අල්ලාගැනීමෙන් එය ලබා ගත් ජයග්‍රහනය "සාදරයෙන් පිලිගත්තේ" ය.

කොලඹ පවතින විසකුරු වාතාවරනය, ඊයේ සිය කතුවැකිය මගින් මනාව උපුටා දැක්වූයේ "මැදහත් මාධ්‍ය" ලෙස සමර්ථය ලබා සිටි ඩේලි මිරර් පත්‍රය යි. "එල්ටීටීඊය හා එහි උග්‍ර ආධාරකරුවන් හැරෙන්නට, මේ රටෙහි කිසිදු පුද්ගලයෙක් හෝ කන්ඩායමක්, මෙම ජයග්‍රහනය පිලිබඳව හමුදාවන්ට ප්‍රසංශා නොකරනු ඇතැයි සිතා ගත නොහැකි ය. දේශපාලන ප්‍රශ්නවලට විසඳුමක් ලෙස අවි ගැටුම් හා ප්‍රචන්ඩත්වය බැහැරකරන කොටස් පවා, අවිහිංසාවාදී ක්‍රම මගින් සාමය උදා කර ගැනීම සඳහා මෙම සිද්ධිය උදව් වනු ඇතැයි සාදරයෙන් පිලිගැනීමට මැලි නොවනු ඇත." එය සඳහන් කරයි.

1994 දී සාමය පොරොන්දුවෙමින් ප්‍රථම වරට බලයට පත් වූ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග එල්ටීටීඊයට එරෙහිව යුද්ධය උත්සන්න කරමින් ගෙන ආ කුප්‍රකට ආදර්ශ පාඨය වූ "සාමය සඳහා යුද්ධය" යන්න කතුවැකියෙන් ප්‍රතිරාවය කරයි. ඇය යටතේ වූ ශ්‍රීලනිපයේ නායකත්වයෙන් යුත් ආන්ඩුව 2002 දක්වා බලයේ සිටි අතර ඒ කාලය තුල කලින් පැවති දක්ෂිනාංශික යූඇන්පී ආන්ඩු යටතේ සිදු වුනාටත් වඩා මරනය හා විනාශය රටට අත් විඳීමට සිදු විය. එල්ටීටීඊයට එරෙහි මැත ම ආක්‍රමනකාරිත්වය සාමය සඳහා "උදව්කාරකයක්" වනවාට වඩා ලේ ස්නානය උත්සන්න කිරීමට පමනක් තුඩු දෙනු ඇත.

මෙම සියලු ම ප්‍රචාරනයන් තුල ආත්ම වංචාවේ මූලයක් පවතියි. සාම්පූර් පිලිබඳව ඇති උද්දාමය මධ්‍යයේ දේශපාලන සංස්ථාපිතයට අතීතයේ සියලු පරාජයන් අමතක වී තිබෙන බවක් පෙනීයන අතර " පරිපූර්න ජයග්‍රහනයක්" අත්කර ගැනීම දශක දෙකකටත් වැඩි කාලයක් තිස්සේ මිලිටරියට මගහැරී ගියේ නම් දැන් එයට හැකියාවක් ඇති බව පෙනී ගොස් තිබේ. සමීපතම සටන්වල ප්‍රතිඵලය කුමක් වුවත්, දිවයිනේ සිවිල් යුද්ධය මුල් බැස ඇත්තේ, පාලක ප්‍රභූ පැලැන්තිය සතුව කිසිදු විසඳුමක් නැති දේශපාලන හා සමාජ ප්‍රතිසතිතාවන් තුල ය. එල්ටීටීඊයට එරෙහිව ලබා ගන්නා ඕනෑ ම "ජයග්‍රහනයක" එකම අර්ථය වනු ඇත්තේ අඛන්ඩව සිදු කරන ලද වාර්ගික වෙනස්කම් කිරීම පිලිබඳව දිවයිනේ දෙමල සුලුතරය අතර ගැඹුරට මුල්බැස පවතින කෝපය හා අප්‍රසාදය වෙනත් රූපයකින් මතුව එනු ඇති බවයි.

වර්තමාන මිලිටරි ප්‍රහාරය ආන්ඩුව විසින් අත්හිටුවන බවට කිසිදු සලකුනක් ඇත්තේ නැත. මෙම සතිය තුල නැගෙනහිර දිස්ත්‍රික්කයේ අම්පාරේ එල්ටීටීඊ කඳවුරුවලට ප්‍රහාරයක් එල්ල කර ඇත. කොලඹ මාධ්‍යවලට අනුව, එල්ටීටීඊයෙන් කැඩී ගිය කරුනා කන්ඩායම මෙම මෙහෙයුම ක්‍රියාත්මක කර ඇත්තේ හමුදාවේ සම්බන්ධය ද ඇතිව ය.

මාස හයක කාලයකට දෙමල පුනරුත්ථාපන සංවිධානයේ (ටීආර්ඕ) සියලු ම අරමුදල් කැටි කිරීමට ශ්‍රී ලංකාවේ මහ බැංකුව පසු ගිය සතියේ අධිකරනයෙන් ලබා ගත් නීති නියෝගය තවත් පියවරකි. එල්ටීටීඊ හිතවත් ටීආර්ඕව 1985 පටන් ක්‍රියාත්මක වන ලියාපදිංචි කල පුන්‍යායතනයකි. 20 වසරක සිවිල් යුද්ධයකින් ද 2004 සුනාමියෙන් ද ව්‍යසනයට මුහුන පා සිටින උතුරු නැගෙනහිර සිවිල් ජනතාවට ටීආර්ඕහි අරමුදල් කපාහැරීම විනාශකාරී ලෙස බලපානු ඇත.

සාම්පූර් අහිමි වීමට එල්ටීටීඊය ප්‍රතිචාර දක්වා ඇත්තේ, ආන්ඩුවේ ක්‍රියා මාර්ගයන් සටන්විරාම ගිවිසුමේ අවසානය යයි තමන් සලකන බව නෝර්වීජියානු තානාපති හාන්ස් බ්‍රැට්ස්කර් වෙත දැනුම් දීමෙනි. දේශපාලන අංශ ප්‍රධානී තමිල්චෙල්වම් මාධ්‍ය වෙත ප්‍රකාශ කර ඇති පරිදි "සටන් විරාම ගිවිසුමේ (සීඑෆ්ඒ) මූලික අවශ්‍යතාවක් වන්නේ පවත්නා පාලන සීමාවන්ට ගරු කිරීම යි." බ්‍රැට්ස්කර් කිලිනොච්චියේ එල්ටීටීඊ මූලස්ථානයෙහි සිටින අතරතුර ගුවන් හමුදාවේ ජෙට් යානාවක් ප්‍රකෝපකාරී ලෙස ගුවනෙහි සැරිසැරී ය.

තමිල්චෙල්වම් යලි වතාවක් හෙලිදරව් කලේ එල්ටීටීඊ ඉදිරි දර්ශනයේ දේශපාලන බංකොලොත්කමයි. ප්‍රහාරය හා දෙමල ජනතාවගේ අවාසනාවන්ත තත්වය පිලබඳව "ජාත්‍යන්තර ප්‍රජාවේ" "නිශ්ක්‍රීය භාවය" ගැන ඔහු පැමිනිලි කලේ ය. ප්‍රධාන බලවතුන්ගේ සහයෝගය ඉල්ලා ආයාචනය කිරීම මුලුමනින් ම නිශ්ඵල ය. "ජාත්‍යන්තර ප්‍රජාව" ඊනියා සාම ක්‍රියාවලියට පිටුබලය සැපයුවේ ශ්‍රී ලංකාවේ ජනතාව ගැන අනුකම්පාවකින් නොව, එක්සත් ජනපදයේ ද අනෙකුත් බලවතුන්ගේ ද කලාපීය අවශ්‍යතාවන්ට හරස්කපන්නා වූ ගැටුම අවසානයකට ගෙන ඒමට ය. "නිශ්ක්‍රීයභාවය" සරලව ම අඟවන්නේ උපායාත්මක වෙනසකි. විශේෂයෙන් ම එක්සත් ජනපදය මිලිටරිමය වසයෙන් ගැටුම නිමා කිරීම සඳහා රාජපක්ෂ ආන්ඩුවේ උත්සාහයන්ට නිහඬව ම සහාය දෙයි. තරමක් අශුභවාදී අනතුරු ඇඟවීමක් සහිතව තමිල්චෙල්වම් ප්‍රකාශ කර ඇත්තේ "දෙමල ජනතාවට එරෙහි ආන්ඩුවේ ක්‍රියා පිලිවෙතෙහි ප්‍රතිඵල සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාව හැසිරෙන ආකාරයට වඩා වෙනස් ලෙස ඔවුන් අනාගතයේ දී සිංහල ජනතාව ද මුහුන පානු ඇති එම ඉරනම සම්බන්ධයෙන් ද ක්‍රියා නොකරනු ඇත. ආන්ඩුව මෙන්ම එල්ටීටීඊය ද මුල්බැස ඇත්තේ ප්‍රතිගාමී වාර්ගික දේශපාලනය තුල ය. මුල්ලකට කොටුවූ කල, එල්ටීටීඊයට කල හැකිවන්නේ අතීතයේ මෙන් ම දෙමල සිවිල් ජනතාවට එරෙහි මිලිටරියේ ප්‍රචන්ඩත්වයට එරෙහිව "සිංහල ජනතාවට" එරෙහිව තමන්ගේ ම ප්‍රචන්ඩ ක්‍රියාවන්ට එලඹීම යි. එවන් පියවරකින් සිදුවනු ඇත්තේ විනාශකාරී සිවිල් යුද්ධය කරා ලුහුටා යෑම සඳහා තවත් තෙල් වැක්කිරීම පමනකි.